පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 08 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

## විෂයය :- නාට්‍ය හා රංගකලාව

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 02

### I කොටස

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- පහත දැක්වෙන කවි ගී පද ඇසුරින් 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. නැතක් හිමවතේ අතු අග දළු කන්නා
වතක් රුවුල වනමින් ගොලු හත් දුන්නා

B. වදුරා ගස උඩ ලිය දළු කද්දී
වැදිරි ගස මුල කදුළු පෙරද්දී

C. වෙදා නටන්නේ පළමුව සබේට එන්නේ
යොදා කියෙන්නේ තාලෙට ගත වෙව්ලන්නේ

D. සෝභාව දේ මෙපුර සිරි විසිතුරු
බලනු මිතුරු මග පියකරු වූ

E. මස්සිනාගෙ මගුලට මම රුහුණු ගියේ
ලස්ස ගනන් බඩු පටවා එන්ට ගියේ

1. පැරණිම ජන නාටකය වන සොකරි හි ගීත ඛණ්ඩය ඇතුළත් අක්ෂරය වන්නේ,
   1) D 2) C 3) A 4) B

2. ශාන්ති කර්ම ගීත ඛණ්ඩය ඇතුළත් අක්ෂරය වන්නේ,
   1) B 2) D 3) A 4) C

3. වැදි ජන සංස්කෘතිය ඉස්මතු වන ගීත ඇතුළත් අක්ෂරය වන්නේ,
   1) B 2) E 3) D 4) A

4. ගැමි ජනයා තම ජීවන වෘත්තියේ පාළුව කාන්සිය මකා ගැනීම සඳහා ගායනා කළ ගීත ඛණ්ඩය ඇතුළත් වන්නේ,
   1) A 2) B 3) D 4) E

5. ජනප්‍රිය නාට්‍ය ගීතය ඛණ්ඩයක් ඇතුළත් අක්ෂරය වන්නේ,
   1) E 2) C 3) B 4) D

- ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.

6. වේදිකා නාට්‍යයක පදනම වන්නේ,
   1) අධ්‍යක්ෂණය ය.
   2) නාට්‍ය පෙළය.
   3) සතර අභිනය ය.
   4) රූපණ ශිල්පියා ය.

7. නාට්‍යයක තේමාව ප්‍රකට වන්නේ මේ නිසාය.

1) කතා වස්තුව නිසා
2) ගීත නිසා
3) දෙබස් නිසා
4) පිටපත නිසා

8. මින් නාට්‍යෝචිත ලක්ෂණයක් නොවන්නේ,

1) කුතුහලයෙන් යුතු වීම.
2) ගැටුම් සහිත වීම.
3) කතාවෙහි ඇති අපූර්ව බව.
4) බුද්ධි ගෝචර නොවීම.

9. නාට්‍ය රංගනය ඉදිරියට තල්ලු කරන බලවේගය වන්නේ,

1) සිතය.
2) ගැටුම.
3) වචන.
4) චරිත.

10. නාට්‍යයක ප්‍රධානතම මාධ්‍ය වන්නේ,

1) පිටපතයි.
2) අංග රචනයයි.
3) භාෂාවයි.
4) ගැටුමයි.

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රකාශ හරි නම් ( ✓ ) ලකුණ ද, වැරදි නම් ( x ) ලකුණ ද යොදන්න.

11. නළුවාගේ හඬ යනු රූපණ භාෂාවේ මාධ්‍යය යි. ( )
12. චරිතයක බාහිර සමාරෝපය සඳහා අංග රචනය උපකාර නොවේ. ( )
13. නාට්‍යයක ගීත ගායනය ආහාර්ය අභිනයට අයත් වේ. ( )
14. නාට්‍ය සංගීතය මගින් ප්‍රේක්ෂකයා තුළ රස ජනනය මෙන්ම විචිත්‍රත්වය මැවිය හැක. ( )
15. අභිරූපණ රංගයක් අතිශෝක්තියෙන් ඉදිරිපත් නොකළ යුතුය. ( )

- අංක 16 සිට 20 ඇති ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.

(බැහැරින් ගෙනෙන දේ/ වර්ණ විනිවිදක / හිංදු ආගම / සවේෂ පුහුණුව / සදාචාර සම්පන්න)

16. ආහාර්ය යන වචනයෙහි අර්ථය .............................................. යන්නයි.
17. ........................................ ජීවිතයක මග පෙන්වන කෘතියකි සිරිත් මල්දම.
18. පසුතල සඳහා ................................................. වැනි තාක්ෂණයන් යොදා ගනී.
19. නළු නිළියන් හා ආනුශංගික අංග භාවිතා කොට රඟ දැක්වීම .............................................. නම් වේ.
20. මහා ශිව රාත්‍රි උත්සවය ........................................ අයත් වේ.

(ලකුණු : 2 X 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

01. වලහා සහ මාෂා නාට්‍ය ඇසුරින් පිළිතුරු සපයන්න.

1. මෙම නාට්‍යයේ අධ්‍යක්ෂකවරයා වන්නේ කවු ද? (ල. 02)
2. මාෂාට උදව් කිරීමට පැමිණෙන්නේ කවු ද? (ල. 02)
3. ''මට පෙනේ ... මට පෙනේ... කන්නෙ එහෙම නෑ මී වද'' ලෙස පවසන්නේ කවු ද? (ල. 02)
4. මාෂා වලහාගේ නිවසට ඇතුලු වන විට නිවසේ දක්නට ලැබෙන දේවල් 04ක් ලියන්න. (ල. 02)
5. වලහාගෙන් බේරී ආච්චී ළඟට යාමට මාෂා යොදන උපක්‍රමය කුමක් ද? (ල. 02)
6. මෙම නාට්‍යයෙන් දරුවෙකු ගොඩ නගා ගත යුතු හොඳ ගති ගුණ 02ක් ලියන්න. (ල. 02)

02.

1. නාට්‍ය පෙළක් ලෙස හඳුන්වන්නේ කුමක් ද? (ල. 02)
2. නාට්‍ය පෙළක අන්තර්ගත විය යුතු කරුණු 04ක් ලියන්න. (ල. 04)
3. නාට්‍ය පෙළ රචනයක් සඳහා යොදා ගත හැකි තේමාවන් 03ක් ලියන්න. (ල. 06)

03.

1. රංග අභ්‍යාස යනු කුමක්ද? (ල. 02)
2. රංග ක්‍රීඩා හා අභ්‍යාස මගින් නළුවෙකුට ලැබෙන ප්‍රයෝජන 04ක් ලියන්න. (ල. 04)
3. රංග ක්‍රීඩාවක් පංති කාමරයේ ඔබ සිදු කළ අයුරු පිළිවෙළින් ලියන්න. (ල. 06)

04.

1. නාට්‍ය නිර්මාණ සඳහා යොදා ගත හැකි සිරිත් විරිත් ඇතුළත් පද්‍ය ග්‍රන්ථය කුමක් ද? (ල. 02)
2. ඔබ දන්නා ජන ගීයක් ලියා දක්වන්න. (ල. 04)
3. ඓතිහාසික කතාවක් හෝ ජන කතාවක් කෙටියෙන් ලියන්න. (ල. 06)

05.

1. ''අභිනය'' යනු කුමක් ද? (ල. 02)
2. සතර අභිනය නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)
3. ඔබ කැමති එක් අනුශංගික කලාවක් නම් කර නාට්‍ය සඳහා එය යොදා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 04ක් ලියන්න. (ල. 06)

06.

1. සමාරෝපය යනු කුමක් ද? (ල. 02)
2. සමාරෝපය කොටස් කීය ද? ඒවා කෙටියෙන් පහදන්න. (ල. 04)
3. රූපණයේ දී නළුවෙකු සැලකිලිමත් විය යුතු කරුණු 04ක් ලියන්න. (ල. 06)

07. පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩ නැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න.

එකොමත් එක ගමක බිනර අම්මා, තාත්තා සමඟ ජීවත් වේ. කලක් ගතවන විට බිනරගේ තාත්තා අසනීප වී මිය යයි. දුක සේ ජීවත්වන බිනර සහ මව පිළිබඳ දැනගන්නා බිනරගේ යාළුවෙක් බිනරට බිත්තර 10ක් ලබා දේ. මෙම අවස්ථාව ඔබ කැමති ලෙස නාට්‍යමය අවස්ථාවක් ගොඩනගන්න.

1. රංග විධාන සහිතව සංවාද ගොඩ නගා තිබීම. (ල. 04)
2. චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩ නගා තිබීම සඳහා. (ල. 04)
3. නොසිතු පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා. (ල. 04)